පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රවර්ථන වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදන සලසා නොතිබුණි.	කඩිනමින් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු සිදුකරන බව.	ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුය.
(ආ)	ප්‍රවර්ථන වර්ෂයේදී මිලදීගත් වායුසමීකරණ යන්ත්‍රයේ වටිනාකම රු.2,931,109 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී අවසන් ගිණුම් සකස් කිරීමේදී ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම් තැබිය යුතුය.
(ඇ)	2023 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණ රු.507,330 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී අවසන් ගිණුම් සකස් කිරීමේදී ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	2023 වර්ෂය වෙනුවෙන් ලද රු.522,503 ක් වටිනා උසාවි දඩ මුදල් ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගතකර තිබුණි.	ඉදිරි වර්ෂයේදී ආදායම් ලෙස නිවැරදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	පළාත් විශේෂ සංවර්ධන ප්‍රධාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් ලැබිය යුතු රු.1,000,000 ක මුදල ණය ගැතියන් ලෙස පෙන්වා නොතිබුණි.	නිවැරදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ලැබිය යුතු ශේෂ ගිණුම් වල නිවැරදිව දැක්විය යුතුය.
(ඊ)	1994 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ භාණ්ඩ සමීක්ෂණය මඟින් ඉවත් කිරීමට යෝජිත රු.218,291 ක පොත් වටිනාකම ගිණුම් තුළින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ගිණුම් මඟින් ඉවත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදි ගිණුම් සකස් කළ යුතුය.

(උ)	තැම්පතු ලෙජරයේ අත රැඳවුම් ලෙස රු.234,353 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ලෙජර් ගිණුම් නිවැරදිව සටහන් කළ යුතුය.
(ඌ)	ප්‍රවර්ථන වර්ෂයේ ව්‍යාපෘති වලට අදාළව රු.9,928,409 ක් ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව ශේෂයන් සහ ගිණුම් අනුව ශේෂයන් 03 ක් අතර රු.5,738,370 ක වෙනසක් පැවතුණි.	ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනස්කම් පරීක්ෂා කර බලා නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.185,917,493 ක් වූ ගිණුම් විෂයන් 06 ක් සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	ඉඩම් හා ගොඩනැගිලි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනිම සඳහා අවශ්‍ය ලියකියවිලි පදවිශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර ඉතිරි ශේෂ ඉදිරියේදී නිවැරදි කරන බව.	ගිණුම් විෂයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	නිර්දේශය
(අ) දරන 15 අංක 1987 ප්‍රාදේශීය සභා පනත			
(i) වගන්තිය 24	සභාව සතු මාර්ග ඉන්වෙන්ට්‍රිගත නොකර තිබුණ අතර එම මාර්ග සියල්ල ගැසට් කිරීමටද කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මේ සියල්ල සම්පූර්ණ කර ගැසට් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය .

(ii) වගන්තිය 119	සතිපොළ නියාමනය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ඉදිරියේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය .
(iii)134 වගන්තිය	සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාළ අංශ දැනුවත් කර ඇති බවත් තක්සේරු කිරීම් සිදුකිරීම ඉදිරියේදී සිදුකරන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය .
(iv)159 වගන්තිය	සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.1,070,513 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කොටසක් අයකරගෙන ඇති බවත් ඉතිරි ශේෂයන්ද අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය .
(ආ) ප්‍රාදේශීය සභා 1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව			
(i) 5 (xii) වැනි රීතිය	ඇප තැබිය යුතු නිලධාරීන් සේවකයින් / නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛPT/03/2021 පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ඇප තැබිය යුතු නිලධාරීන් / සේවකයින් නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 අනුව කටයුතු කළ යුතුය.
(ii) 193 වැනි රීතිය	අයවැය හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්තය හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයන් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි වසරේ අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය.
(iii) 218 වැනි රීතිය	පිරිවැය රු.160,952,333 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි.	වර්ෂයට පෙර 2015 ස්ථාවරවත්කම් ලේඛන ගත වී නොමැති බවත් වත්කම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය.

(ඇ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 02/චක්‍රලේඛය 2018	චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	දරණ 19 අංක 2018 16 විගණන පනතේ(2) උප වගන්තිය	සභාවේ කාර්යසාධන වාර්තාව අවසන් ගිණුම් සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන බව.	විගණන පනත අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.3,635,829 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.1,946,727 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
කුලී	800	753	760	44	700	647	640	51
වෙළඳ බලපත්‍ර ගාස්තු	720	913	899	174	500	746	740	160
වෙනත් ආදායම්	20,000	17,314	17,205	853	12,000	15,127	14,383	744
එකතුව	21,520	18,980	18,864	1,071	13,200	16,520	15,763	955

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නැගෙනහිර පළාත් සභාව මඟින් සම්මත අතුරු ව්‍යවස්ථා අතර ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද එම අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.	පළාත් සභාව මගින් නිකුත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව මෙම ආයතනය විසින් අදාළ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කර ගනිමින් සිටින බවත් අදාළ ආයතන වෙත ලිඛිත දැනුවත් කිරීම් සිදු කර ඇති බව.	ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සියලු කාර්යයන් හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ආදායම් උත්පාදනය කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින බවත් ඉදිරියේ දී නිශ්චිත සැළසුම් සහිතව අතුරු ව්‍යවස්ථා පනවා තවත් නව ආදායම් උත්පාදනය කළ හැකි පරිදි කටයුතු සිදුකළ යුතු බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය .

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සංවර්ධන බලපත්‍ර 02 ක් නිකුත් කර ඇති අතර වර්ෂය 2024 25 සඳහා ලැබුණු ඉල්ලුම්පත් 09 වෙනුවෙන් සංවර්ධන බලපත්‍ර ක්ද නිකුත් කර තිබුණු නමුත් බල ප්‍රදේශයේ කිසිඳු අනවසර ඉදිකිරීමක් වාර්තා නොවී තිබීම නිසා මෙම කාර්යයන් නියාමනය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.	බල ප්‍රදේශයේ ම ඇති සියළුම ඉදිකිරීම් සඳහා සංවර්ධන බලපත්‍ර ලබා දිමට කටයුතු කරමින් සිටින බව.	ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කළ යුතුය.
(ආ)	සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිසි සැලසුමක් නොතිබුණි . කෙසේ වෙතත් නගරයේ කසල 2022 වෙන්කර ලබා ගැනීම සඳහා .වර්ෂයේදී රු959,820 ක් වැයකර කසල බඳුන් මිලදී ගෙන තිබුණු නමුත් වෙන්කළ කසල ලබා ගැනීමේදී වෙන්කළ කසල නැවත මිශ්‍ර වන බැවින් ඒ සඳහා වැයකර තිබුණු මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.	සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා වන නව සැලැස්මකට අනුව ක්‍රියා කිරීමට කටයුතු සිදු කර ඇති බව.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.336,457 ක් වූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.	මේවා ක්‍රමවත්ව විසඳීමට කළමනාකරන කමිටු රැස්වීමේදී හා විගණන කළමණාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	අත්තිකාරම් ශේෂය නිරවුල් කළ යුතුය.
(ආ)	දිගින් දිගටම පවතින රු.3,256,708 ක් වූ කොන්ත්‍රාත් තැන්පත් නිදහස් කිරීමට හෝ සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.	එම	කොන්ත්‍රාත් පාලනය මනාව සිදු කළ යුතුය.
(ඇ)	වටිනාකම රු.1,745,236 ක් වූ විවිධ තැන්පත් හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේවා ක්‍රමවත්ව විසඳීමට කළමනාකරන කමිටු රැස්වීමේදී හා විගණන කළමණාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	තැන්පතු කල් ඉකුත් වූ ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත සේවක මණ්ඩලය හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු ක් 16 ක පුරප්පාඩු 11 පවතුණි.	අදාළ අංශ වෙතින් ලිඛිතව පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් කර ඇති බවත් ඉදිරි වර්ෂයේදී නැවත ඉල්ලීම් කිරීමට කටයුතු කරන බව.	පුරප්පාඩු පියවීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවේ සේවය කරන පුස්තකාල සහායිකාවකට 2024 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ එකම වැටුප් වර්ධනයක්වත් ගෙවීමට කටයුතු කර .නොතිබුණි	පිළිතුරු ලබා දී නොමැත.	සේවක අභිප්‍රේරණ වන පරිදි නියමිත දිනට වැටුප් වර්ධක ලබාදිය යුතුය.

3.5 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 02/2017 දරන 2012 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයත් නොවන පිරිවැය රු.18,009,050 ක් වූ වාහන 05 ක් නිසි පරිදි පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.	වත්කම් කළමනාකරණය පවරා නොගත් වත්කම් සම්බන්ධව පළාත්වල අමාත්‍යාංශය හා RMV ආයතනය සමඟ සාකච්ඡා කර ඇති අතර පවරාගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරන බව	කඩිනමින් වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර තිබුණ අතර ප්‍රවර්ථන වර්ෂයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන් හඳුන්වා දී නොතිබුණි. එසේම අභ්‍යන්තර විගණන සැලැස්මක් සක කොට ජාතික විගණන කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	කාර්යබහුල වීම හා සභාවේ සේවක හිඟය හේතුවෙන් අතපසු වීම් සිදු වූ අතර ඉදිරියේදී මෙවැනි අතපසුවීම් වලින් තොරව කටයුතු කරන බව	අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 09 සිට සියයට 58 දක්වාද වියදම් විෂයන් 05 ක සියයට 17 සිට සියයට 39 ක් දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	පිළිතුරු ලබා දී නොමැත.	අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
1980 අංක 47 දරන ජාතික පරිසර පනතට සිදු කළ සංශෝධන ප්‍රකාරව කටයුතු නොකිරීමත් වර්ගීකරණය කර එකතු කරනු ලබන කසල නැවත මිශ්‍ර වීමත්, ඒවා නිදහස් පරිසරයට මුදා හැරීමත් නිසා ගංවතුර අවස්ථාවලදී මෙන්ම දැඩි වර්ෂා කාලවලදී අක්‍රමවත්ව බැහැර කරන ලද කසල ජල මාර්ගවලට මුසු වීමෙන් ජලජ ජීවීන්ට මෙන්ම වන සතුන්ට හා මානව වර්ගයාට පාරිසරික ගැටළු ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.	සභාව මගින් එකතු කරනු ලබන කසල බැහැර කරන කසල අංගනයේ වැසි කාලවලදී අපද්‍රව්‍ය වැසි ජලය සමඟ මිශ්‍රවීම අවම වන ආකාරයටත් පරිසරය හා වනසතුන්ට වන හානිය අවම වන ආකාරයටත් එම අංගනය සකස් කර ඇති බව.	කසල බැහැර කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර නියාමනය මනාව සිදු කළ යුතුය.